2007 ඔක්තෝබර් 31

භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛ අංක: 6/2007

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
දිස්ත්‍රික් ලේකම්වරුන් ,

**මූල්‍ය කළමනාකරණයේ ඵලදායීතාව සහ කාර්යක්ෂමතාව ලඟා කර ගැනීම සඳහා රජයේ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු වෙනුවෙන් නව බැංකු ගිණුම් ජාලයක් හඳුන්වාදීම.**

උක්ත කාරණය හා සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2007 සැප්තැම්බර් 05 දිනැති භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛ අංක 5/2007 කෙරෙහි ඔබේ අවධානය යොමු කෙරේ.

02. එම චක්‍රලේඛයේ සඳහන් පරිදි නව බැංකු ගිණුම් විවෘත කිරීම පිණිස අදාල ලියවිලි භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම ආයතන ගණනාවක් විසින් ඉටුකර නොමැති බැවින්, එවැනි ගිණුම් සඳහා ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කිරීමේ අවසාන දිනය 2007 නොවැම්බර් 19 දින දක්වා දීර්ඝ කෙරේ. එම ගිණුම් සඳහා පමණක් ඉහත චක්‍රලේඛයේ සඳහන් ඉලක්ක දිනයන් පහත සඳහන් පරිදි සංශෝධනය කරමි.

ඒ අනුව භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛ අංක 5/2007 හි ,

(i) 1(ඇ) සහ 2 (1) (ඈ) ඡේද වල සඳහන් 2007 නොවැම්බර් 01 යන්න 2007 දෙසැම්බර් 01 වශයෙන්ද,
(ii) 2(1) (ඇ) සහ (ඈ) ඡේද වල සඳහන් 2007 ඔක්තෝබර් 31, 2007 නොවැම්බර් 30 වශයෙන්ද,
(iii) 2(1) (ඉ) ඡේදයේ දැක්වෙන 2007 දෙසැම්බර් 31, 2008 ජනවාරි 31 වශයෙන්ද,
(iv) 3 ඡේදයේ සඳහන් 2008 ජනවාරි යන්න 2008 පෙබරවාරි වශයෙන්ද සංශෝධනය විය යුතුය.

03. මෙම වැඩපිළිවෙල ක්‍රියාත්මක දිනයන් නැවත සංශෝධනය කිරීමක් ලබා නොදෙන හෙයින් නියමිත දිනට පෙර අදාල අයදුම්පත්‍ර ඉදිරිපත් කර තම ආයතනය වෙනුවෙන් අදාල ගිණුම් විවෘත කර ගැනීමට කටයුතු කරන ලෙස මෙතෙක් අදාල චක්‍රලේඛය පරිදි කටයුතු නොකල සියලුම ආයතන වෙත දන්වා සිටිනු ලැබේ.

04. ඉහත චක්‍රලේඛය පරිදි දැනටමත් නව බැංකු ගිණුම් විවෘත කරන ලද ආයතන වලට මෙම සංශෝධනයන් බල නොපානු ඇත.

ලලිත් ආර්. ද සිල්වා
**අධ්‍යක්ෂ ජනරාල්**
**භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව**

පිටපත්:-
1. විගණකාධිපති
2. සාමාන්‍යාධිකාරී-ලංකා බැංකුව/මහජන බැංකුව
3. ප්‍රධාන ගණකාධිකාරී/අධ්‍යක්ෂ (මුදල්) ..........................................